# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/67 – 2019 සැප්තැම්බර් මස 25 වැනි බදාදා – 2019.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29(3) වැනි වගන්තිය යටතේ අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2019 ඔක්තෝබර් මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ආර්. පී. ආර්. රාජපක්ෂ,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05.
කම්කරු මහලේකම් කාර්යාලයේදී ය.

1A – PG4656 – 206 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1946 මැයි මස 24 වැනි දින අංක 9560 දරන *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කළට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 මාර්තු මස 27 වැනි දින අංක 1803/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II හා III වන කොටස් වෙනුවට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.

### II වන කොටස

මත්පැන් හා විනාකිරි කර්මාන්තයේ ඇතැම් කාර්යයන්ට අදාළ වන්නා වූ කැලි මිම්මේ වැඩට ගෙවිය යුතු අවම වේතන:

| *කාර්යය* | *ප්‍රමාණය* <br> *රු. ශත* |
|---|---|
| පොල් ගස් ඇදීම "එක් ඇඳුත්තකට" | 78.00 |
| කඹ මාරු කිරීම "එක් ඇඳුත්තකට" | 38.00 |
| කඹ කපා අස්කිරීම "එක් ඇඳුත්තකට" | 33.00 |
| පොල් ගස් හැර ඇරීම "ගස් 110 කට වැඩි නොවන අතුරකට" | 3,938.00 |
| | *රු. ශත* |
| **තැබෑරුම්වලට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීමට:** | |
| ගාලු දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 61.00 |
| බස්නාහිර පළාතේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 129.00 |
| හලාවත දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 122.00 |
| නුවරඑළියේ හෝ මහනුවර දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| මාතර, යාපනේ හෝ මාතලේ දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 122.00 |
| පුත්තලම, අනුරාධපුර, කුරුණෑගල හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 129.00 |
| බදුල්ල හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| මඩකලපුව හෝ මන්නාරම දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| කෑගලු දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 90.00 |
| ත්‍රිකුණාමලය හෝ මුලතිව් දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 117.00 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීමේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 28.00 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස මල් තැලීමට | 3,600.00 |
| පොල්, කිතුල් හෝ තල්ගස් 100කට වැඩි නොවූ විට 100ට වැඩි එබඳු සෑම ගසකට | 38.00 |
| තැබෑරුම්වල රා සැපයීම පිණිස මල් තැලීම - පොල්, කිතුල් හෝ තල්ගස් 25-40 දක්වා | 3,435.00 |

කම්කරුවකු අරක්කු කර්මාන්තය සඳහා හෝ විනාකිරි සෑදීමේ කර්මාන්තය සඳහා හෝ රා මැදීමට යොදවා ගන්නා සෑම විටකම ඔහු විසින් ගෙනවිත් දෙන රාවල ඝන ප්‍රමාණයෙන් 7.5%ක මද්‍යසාර ප්‍රමාණයක් තිබිය යුතුය යන කොන්දේසියට යටත්ව පොල්, කිතුල් හෝ තල්ගස් මැදීම පිළිබඳව පූර්වෝක්ත වේතන ප්‍රමාණය ඔහුට ගෙවිය යුතුය. එසේ වුවත්, එකී රාවල ඝණ ප්‍රමාණයෙන් 7.5% කට අඩු මද්‍යසාර ප්‍රමාණයක් තිබේ නම්, ඉහත කී වේතනයට අනුපාතිකව ඔහුට ගෙවිය යුතුය.

### III වන කොටස

මෙහි පහත I වන තීරයේ නිශ්චිතව දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය II වන තීරයේ දැක්වෙන අනුරූප පඩි ප්‍රමාණයක් විය යුතුය.

යම් මාසයක දී කම්කරුවෙකු අවසර නොමැතිව දින 4 කට වැඩියෙන් නොපැමිණි විට අනුමත නිවාඩු දින 4 ඉක්මවන දින ගණනට, ඔහුගේ මාසික වැටුපෙන් අනුපාතික ප්‍රමාණය අඩුකර ඉතිරි වැටුප ගෙවිය යුතුය.

| *I වැනි තීරය*<br>**කම්කරු පන්තිය** | *II වැනි තීරය*<br>**ප්‍රමාණය මසකට** |
|---|---|
| *පහත දැක්වෙන සේවයේ නියුක්ත වූවන්ට* | *රු. ශත* |
| අතුරු කංකානමගේ වැඩ | 17,130.00 |
| රා තැබෑරුම් කාවල්කාර වැඩ | 14,580.00 |
| අරක්කු තැබෑරුම් කාවල්කාර වැඩ | 14,580.00 |
| අතුරු කාවල්කාර වැඩ | 13,972.00 |
| එකතු කිරීමේ ස්ථානයේ කළමනාකාර වැඩ | 15,675.00 |
| තැබෑරුම්වල රා විකිණීමේ වැඩ | 15,427.00 |
| තැබෑරුම්වල අරක්කු විකිණීමේ වැඩ | 15,427.00 |
| ව්‍යාපාරික අංශයේ (රා ගෙනයාම, රා පීප්ප පැටවීම හා බෑම, ලේහර බාල්දි, ටින් හා වෙනත් භාජන සේදීමේ වැඩ ද ඇතුළුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම | 15,675.00 |
| ව්‍යාපාරික විනාකිරි අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුලුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම | 14,100.00 |
| ස්කාගාරයේ දී රා පෙරීම | 14,655.00 |
| අරක්කු බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් ඇලවීම | 13,972.00 |
| දර කැපීම හා පැලීම, ස්කාගාරවලදී පීප්ප, බාල්දි හා වෙනත් භාජන ශුද්ධ කිරීම හා සේදීම, අරක්කු ගෙනයාම, පැටවීම, බෑම, අරක්කු මැනීම, රා බෝතල් කිරීම හා ඇබ ගැසීම, විනාකිරි සෑදීම, විනාකිරි බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් කිරීම, බෙදා හැරීම පිණිස විනාකිරි ගෙනයාම | 13,972.00 |

ව්‍යාපාරික අරක්කු අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුළුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම

| | |
|---|---|
| 80ට නොවැඩි ගස් ගණනක් සඳහා | 14,460.00 |
| 81ට නොඅඩු හා 90ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 14,662.00 |
| 91ට නොඅඩු හා 100ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 14,865.00 |
| 101ට නොඅඩු හා 110ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,067.00 |
| 111ට නොඅඩු හා 120ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,270.00 |
| 121ට නොඅඩු හා 130ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,472.00 |
| 131ට නොඅඩු හා ඊට වැඩි ගස් ගණනක් සඳහා | 15,675.00 |

10 - 368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.